# 16 පැවිදි දිවිය

## පැවිදි දිවියේ ඓතිහාසික පසුබිම

මුල් යුගයේ දී තාපසයන් ගෘහස්ථ ජීවිතයක් ගත කළත් තුන්වන සියවස පමණ වන විට සාමූහික ව ජීවත් වූ බවට සාක්ෂි ඇත. ආරණ්‍යවාසී තාපසයන් අතර පළමුවැන්නා තීබ්ස්හි පාවුලු තුමා ය (ක්‍රි.ව. 227-342). එතුමාගේ ගෝලයකු වූ ඊජිප්තුවේ ශුද්ධ වූ අන්තෝනි තුමාගේ කාලයේ කාන්තාර ආශ්‍රිත ව තාපසයන් 5000ක් පමණ සිටි බව වාර්තා වේ. පසු කාලීන ව නව තාපස ජනපද ඇති විය. තාපසයෝ තම ආධ්‍යාත්මික වර්ධනය සඳහා දැඩි දුෂ්කරතා විඳිමින් සාමූහික ජීවිත ක්‍රමයකට දායක වූහ.

තාපස ජීවිතය ක්‍රමවත් කරමින් ඊට මෙහෙවර කළ පුද්ගලයන් අතර ශුද්ධ වූ බැසිල් ජෙරොම්, අගොස්තීනු හා අම්බ්‍රෝස් තුමන්ලා ගැන සඳහන් කළ හැකි ය. තාපස දිවියේ පුරෝගාමීන් ලෙස ශුද්ධ වූ බෙනඩික් හා ජාකෝමියස් තුමන්ලා සැලකිය හැකි ය. විශේෂයෙන් තාපස පැවිදි ජීවිතයකට විනය මාලාවක් සකස් කළේ මෙතුමන්ලා ය.


> කන්ද මත භාවනා කරමින් සිටියා වූ ද ජනතාවට දේව රාජ්‍යය දේශනා කළා වූ ද රෝගීන් හා අංග විකලවුන් සුවපත් කළා වූ ද පව්කාරයන් ධර්මිෂ්ඨ බවට පත්කළා වූ ද බාලයන්ට ආශීර්වාද කළා වූ ද සියල්ලන්ට යහපත කළා වූ ද තමන් එවා වදළ පියාණන් වහන්සේට නිතර කීකරුකමින් සිටියා වූ ද ක්‍රිස්තුන් වහන්සේ පැවිදි අය මගින් ප්‍රකාශ කළ යුතු වන්නේ ය.
>
> (ජාතීන්ගේ ආලෝකය අංක 46)


පැවිදි ජීවිතය තුළ කිතුනුවකු තම ප්‍රසාද ස්නාපනීය පොරොන්දු වැඩි වගකීමකින් යුතු ව පුළුල් ලෙස ඉටු කරයි. පැවිදි තත්ත්වය යනු දේව කැඳවීමක් මෙන් ම විශේෂ දීමනාවක් ද වේ. ඔහු/ඇය වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද ශුභාරංචිය ප්‍රකාශ කරන්නකු විය යුතු ය.

**පැවිදි වේද භාර 3 කි**

- **ව්‍රතශුද්ධිය** - විවාහ නොවී තම මුළු ජීවිතය ම දේව රාජ්‍යය උදෙසා කැප කිරීම
- **කීකරුකම** - පැවිදි නිකායේ ශ්‍රේෂ්ඨයන්ට කීකරු වීම
- **දිළිඳුකම** - මෙලොව කිසි ම දේපළකට උරුමකම් නොකීම


නොමිලේ බෙදාහැරීම සඳහා ය.




## පැවිදි පූජක

- ★ නිර්මල මරිය නිකාය
  - දිළිඳුන්ට සුබ අස්න දේශනා කිරීම
  - අධ්‍යාපන සේවය
  - ධර්මෝපදේශ කටයුතුවල නිරත වීම
  - ධර්මදානය
- සිල්වෙස්ත්‍රෝ බෙනදික්ත නිකාය
  - අධ්‍යාපනය
  - මීසම් සේවාව
  - දේව මහිමය සඳහා සාමුහික ව දිවි ගෙවීම

## පැවිදි සොහොයුරන්ගේ නිකායන්

- ★ මාරිස්ට් සහෝදරතුමන්ලා
  - අධ්‍යාපන සේවය
  - තරුණයන් සඳහා ස්වයං රැකියා
- ★ දයාවේ සහෝදරතුමන්ලා
  - අධ්‍යාපනය
  - සමාජ සේවා
- ★ සාන්ත ජෝන් බැප්ටිස්ට් ද ලා සාල් නිකාය
  - අධ්‍යාපන සේවය
  - තරුණ ජීවිතය සඳහා විවිධ සේවා
- ★ ෆ්‍රැන්සිස්කාන ධර්මදූත සහෝදරතුමන්ලා
  - ධර්මදානය
  - ළමා නිවාස පවත්වා ගෙන යාම

## පැවිදි සොහොයුරියන්ගේ නිකායන්

- ★ ශුද්ධ වූ පවුලේ නිකාය
  - අධ්‍යාපන සේවය
  - ධර්මෝපදේශ සේවය
  - ළමා, තරුණ හා පවුල් සේවාව
  - ධර්මදූත සේවය
  - මීසම තුළ විවිධ සේවා
- ★ යහපත් එඬේරාගේ පැවිදි නිකාය
  - ගොළු හා බිහිරි ළමුන් සඳහා අධ්‍යාපනය
  - තරුණ තරුණියන්ට මඟ පෙන්වීම
  - අසරණ අයට පිහිට වීම
- ★ සුරදූත පැවිදි නිකාය
  - පාසල් සේවය
  - ළමා නිවාස පවත්වා ගෙන යාම
  - ළමා පරපුර හා තරුණයන් වෙනුවෙන් සේවය
- ★ දයාවේ සහෝදරියෝ
  - අධ්‍යාපන සේවය
  - මහළු නිවාස පවත්වා ගෙන යාම
  - ධර්මෝපදේශ සේවය
  - ධර්මදානය

★ සිරි කුරුස නිකාය

සෞඛ්‍ය සේවය

වතුවල සේවය

ධර්මෝපදේශ කටයුතුවල නිරත වීම

සමාජ සේවා කටයුතුවල නිරත වීම

★ දිළිඳුන්ගේ කුඩා සොයුරියෝ

මහළු නිවාසවල දයා සේවය

**ක්‍රියාකාරකම**

1. "පැවිදි ජීවිතය" පිළිබඳ ව කතෝලික පුවත් පතකට ලිපියක් සකස් කරන්න.
2. පැවිදි ජීවිත තුළින් අපගේ ජීවිතවලට ලබා ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න.
3. පැවිදි ජීවිතවලට පැමිණෙන පරීක්ෂාවලින් ජය ගැනීමට ඔවුනට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ඉල්ලා ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට යාච්ඤාවක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

*පැවිදි අයගේ සේවාව අගය කරමු.*